**ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව - 2022**

-----------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 **විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ**.**

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත**.**

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අක්කර 01 රූඩ් 03 ක් හා පර්චස් 05.26 ක ඉඩමක් තක්සේරු වටිනාකම රු.9,993,990 කට පවරා දීමට එකඟ වී ඇති නමුත්, ඒ සම්බන්ධයෙන් කිසිදු වෙන් කිරිමක් හෝ හෙළිදරව් කිරීමක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු සභාව සතු ස්ථාවර තැන්පත් භාවිතයෙන් සිදු කිරීමට කටයුතු කරන බව. | හෙළිදරව් කළ යුතුය |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වැය කර තිබුණු රු.5,931,336 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී, කඩා ඉවත් කළ රු.1,000,000 ක් වූ සභාවේ රථ ගාලේ වටිනාකම ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී ගිණුම්වලින් ඉවත් කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කසළ අංගනයේ පැවති රු.249,328 ක් වටිනා පොහොර තොග ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ දී පවතින තොගය ගිණුම්ගත කරන බව. | තොග ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තුව හා ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සළසා නොතිබුණි. | 2023 වර්ෂයේ දී ගිණුම්ගත කරන බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |

1.6.3 **විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් රු.8,406,517 ක ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු හෝ පැවරුම් නියෝග ඉදිරිපත් නොකෙරුණි. | මූල්‍ය ප්‍රකාශනවල ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | ඔප්පු හා පැවරුම් නියෝග ලබා ගත යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 2008 පෙබරවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් පත්‍රය | කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර 35 ක් අලුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිසර පනතේ විධිවිධාන ප්‍රකාරව විටින් විට කර්මාන්තකරුවන් දැනුවත් කරමින් ලිපි යොමු කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.37,491,762 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,703,146 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,435,115 | 3,394,445 | 3,767,931 | 1,637,821 | 4,859,095 | 3,683,941 | 3,447,840 | 2,011,308 |
| (ii) | කුලී | 19,903,000 | 8,459,778 | 8,553,949 | 1,324,701 | 6,293,000 | 8,411,196 | 7,969,831 | 1,418,872 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,175,100 | 1,161,658 | 760,358 | 1,430,700 | 1,185,100 | 1,053,250 | 811,550 | 1,029,400 |
| (iv) | වෙනත් ආදායම් | 40,937,500 | 56,326,332 | 46,110,238 | 34,617,301 | 34,849,500 | 31,827,434 | 31,472,016 | 24,301,207 |
| | එකතුව | 66,450,715 | 69,342,213 | 59,192,476 | 39,010,523 | 47,186,695 | 44,975,821 | 43,701,237 | 28,760,787 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමස්ත ආදායම් ප්‍රභවයන්ගෙන් 2021 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.28,760,787 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟය රු.39,010,523 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 36 ක් විය. | විධිමත් සැලැසුමකට අනුව ආදායම් අය කර ගැනීමේ කටයුතු සිදු කරන බව. | හිඟ ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | **වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට හිඟ වරිපනම් ශේෂ එකතුව රු.1,398,646 ක් වූ අතර, ඉන් අවුරුදු 01 ත් 05 ත් අතර කාල සීමාව සඳහා ලැබිය යුතු වරිපනම් ශේෂය රු.665,312 ක් හා අවුරුදු 05 ඉක්ම වූ ලැබිය යුතු වරිපනම් ශේෂය රු.276,373 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් කාලීනව අය කළ යුතුය. |
| (ඇ) | **අක්කර බදු**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අක්කර බදු හිඟය රු.101,624 ක් වූ අතර, ඉන් අවුරුදු 01 ත් 05 ත් අතර ශේෂය රු.15,563 ක් හා අවුරුදු 05 ට වැඩි ශේෂය රු.72,258 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කළ යුතුය. |
| (ඈ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කඩ කාමර කුලී හිඟ ශේෂ එකතුව රු.1,324,701 ක් වූ අතර, ඉන් අවුරුදු 01 ත් 05 ත් අතර ශේෂ එකතුව රු.523,355 ක් හා අවුරුදු 05 ට වැඩි ශේෂය රු.170,996 ක් විය. | කඩ කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අය කළ යුතුය. |
| (ඉ) | **ත්‍රී රෝද රථ ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ත්‍රීරෝද රථ ගාස්තු හිඟ ශේෂ වටිනාකම රු.1,304,700 ක් වූ අතර, එයින් අවුරුදු 01 ට අඩු ශේෂය රු.373,800 ක් ද, අවුරුදු 01 ත් 05 ත් අතර ශේෂය රු.843,800 ක් හා අවුරුදු 05 ට වැඩි ශේෂය රු.87,100 ක් විය. | ත්‍රී රෝද රථ හිඟයෙන් රු.16,200 ක් අය කර ඇති අතර, ඉතිරි හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| 2.2.3 | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,378,284 ක් හා මුද්දර ගාස්තු රු.33,004,000 ක් විය. | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව | උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කළ යුතුය |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | ඉදිරියේ දී අවශ්‍යතාවය මත අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාව විසින් පවත්වා ගෙන යන ජල ව්‍යාපෘති 08 ක ජල සාම්පල් පරීක්ෂාවන් සිදු කර නොතිබුණු අතර, එමගින් ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | ව්‍යාපෘති 03 ට අදාළව ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කර නොමැති බවත්, සාම්පල් පරීක්ෂා කරන ලෙස ප්‍රජාමූල සංවිධාන දැනුවත් කර ඇති බව. | ජල සාම්පල් පරීක්ෂා කර මහජනයාට පිරිසිදු පානීය ජලය ලබා දීමට කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කුරුඳුවත්ත කඩ කාමර 29 ක් ගිවිසුම්ගත විමකින් තොරව බදු දී තිබුණු බැවින්, හිඟ කුලී අය කිරීම හා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම ද ගැටළුකාරී තත්ත්වයක් බව නිරීක්ෂණය විය. | මුල් අයිතිකරුවන් සොයා ගැනීමෙන් අනතුරුව මෙම කඩ කාමර සඳහා ගිවිසුම්ගත වීමට කටයුතු කරන බව. | විධිමත්ව ගිවිසුම්ගතවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට කර්මාන්ත ණයගැති ගිණුමේ ශේෂය රු.14,024,328 ක් වූ අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂය රු.6,539,297 ක් හා වසර 05 ඉක්ම වූ ශේෂය රු.96,829 ක් අය කර ගෙන නොතිබුණි. | රු.3,184,952 ක මුදලක් අය හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | ලැබිය යුතු ගිණුම් ශේෂ අය කර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.35,181,200 ක් පැවති අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර කාලයට අදාළ ශේෂවල එකතුව රු.9,463,330 ක් හා වසර 05 ඉක්ම වූ ශේෂය රු.125,894 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවීමට ඇති මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අසුපිනි ඇල්ල සංචාරක ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ කොටසක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.11,006,088 ක් වැය කර තිබුණ ද, භාවිතයට ගැනීමට නොහැකිවී තිබුණි. | ප්‍රතිපාදන ලැබී නොමැති බවත්, අඩු ආදායම්ලාභී සභාවක් බැවින්, ලක්ෂ 40 ක් යොදවා ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නොහැකි වූ බව. | ව්‍යාපෘතිය නිම කර මහජන අවශ්‍යතා ඉටු කළ යුතුය. |

3.3 **වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වත්කම් ලේඛනගත නොකිරීම**<br>බල ප්‍රදේශයේ පිහිටා ඇති ළිං 180 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | බල ප්‍රදේශයේ පිහිටා ඇති ළිං හඳුනා ගැනීම සඳහා ඉදිරියේ දී කටයුතු කරන බව. | වත්කම් හඳුනා ගත යුතුය. |
| (ආ) | **පවරා නොගත් වත්කම්**<br>සභාව පරිහරණය කරන ජීප් රථයක් සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | භාරකාරීත්ත්වය පවරා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා ලිපි ඉදිරිපත් කර ඇති බව. | වත්කම් පවරා ගැනිමට කටයුතු කළ යුතුය. |

3.4 **මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සමර්සෙඩ් කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානය 2022 මාර්තු 25 දින කාර්යය අවසන් කර මෙම මධ්‍යස්ථානයට විවිධ ආයතනවලින් පරිත්‍යාග ලෙස ලැබුණු ඇඳන් හා උපාංග 297, ප්ලාස්ටික් පුටු 301, ලී ස්ටූල් 23, රූපවාහිනී හා උපාංග 04, රෙදි සෝදන යන්ත්‍ර 03, කෑම මේස 08, ජෙනරේටරයක්, විදුලි පංකා 63, CCTV කැමරා 16, වතුර මෝටර් 07, ප්ලාස්ටික් වතුර ටැංකි 07 ක්, වතුර පිල්ටර් 07 හා ශීතකරණයක් ඇතුළු උපකරණ 2022 මාර්තු 25 දින ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් විසින් ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය සභාවේ, සභාපති වෙත ලිඛිතව භාර දී තිබුණි. එසේ වුව ද, 2023 මාර්තු 03 දින සිදු කළ විගණනයේ දී එම කිසිදු උපකරණයක් ලේඛනගත කර නොතිබුණු අතර, එම උපකරණ නිකුත් කළ ආයතනයක් හෝ භෞතිකව පරීක්ෂාවට හෝ ඉදිරිපත් නොකෙරුණි. | මෙම රෝහලට ලද සියලුම භාණ්ඩ ලේඛනගත කිරීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදු කර ඇති අතර, රෝහල වසා දමන අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම් විසින් සභාවේ සභාපතිවරයා වෙත සියලුම භාණ්ඩ ලිඛිතව භාර දී ඇති බව. | ලේඛනගත කිරීම හා නිකුත් කිරීම් ලිඛිතව තහවුරු කළ යුතුය. |

3.5 **කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ජයමාලපුර 08 වන පටු මග ඉන්දික මහතාගේ නිවස අසළින් යන මාර්ගය සංවර්ධනය - රු.541,377** | | |
| i. | 2021 මාර්තු 17 දිනැති අංක SMRR/PL/01/Cir දරන මහා මාර්ග අමාතයාංශයේ චක්‍රලේඛයේ 03 ඡේදය අනුව, ව්‍යාපෘති තෝරා ගැනීමේදී, අතුරු මාර්ග වැඩි ප්‍රමාණයකට ප්‍රවේශ සහිත, වැඩි පවුල් සංඛ්‍යාවකට ප්‍රතිලාභ සැලසිය හැකි මාර්ග තෝරාගත යුතු වුවත්, මෙම මාර්ගය වෙනත් මාර්ගයකට ප්‍රවේශ විය හැකි මාර්ගයක් නොවන බවත්, ප්‍රතිලාභී පවුල් 04 ක් පමණක් පදිංචි මාර්ගයක් බවත් නිරීක්ෂණය විය. | මෙම මාර්ගය පොදු මාර්ගයක් හා ඉදිරියේදි ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව වැඩි වීමේ අරමුණ ඇතිව මෙම මාර්ගය සංවර්ධනය කිරිමේ කටයුතු සිදු කළ බව. | ප්‍රමුඛතාවය සලකා බලා මාර්ග ඉදිකළ යුතුය. |
| ii. | පැළ සිටුවීම සඳහා රු.10,000 ක් බිල්කර තිබූ නමුත්, මාර්ගය දෙපස පැල සිටුවා නොතිබුණි. | මෙම මාර්ගයට අදාළ පැළ උලපනේ ඩෙන්මාර්ක් කසල අංගනය පිහිටි භූමියේ සිටුවා ඇති බව. | ඇස්තමේන්තුව අනුව කාර්යය ඉටු කළ යුතුය. |
| (ආ) | **මලංගමුව සිට ගලාහේන දක්වා මාර්ගය සංවර්ධනය - රු.890,434** | | |
| i. | මාර්ගය මීටර් 106.9 ක් දුරට ඉදිකළ බවට අධීක්ෂණ නිලධාරින් නිර්දේශ කර ගෙවීම් කර තිබුණ ද, භෞතික පරීක්ෂාවේදී මීටර් 100.8 ක් දුරට පමණක් කොන්ක්‍රීට් අතුරා තිබුණු බවක් නිරීක්ෂණය වූයෙන්, මීටර් 06 ක් කොන්ක්‍රීට් ඇතිරීමකින් තොරව සණ මීටර් 2.2 ක් සඳහා රු.50,289 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මෙලෙස වැඩිපුර මුදල් ගෙවා ඇත්නම්, සියයට 10 තැන්පත් මුදල්වලින් අඩු කිරිමට කටයුතු කරන බව. | ගෙවීම් නිර්දේශ කළ නිලධාරීන් සම්බන්ධව කටයුතු කළ යුතුය. |
| ii. | පැළ සිටුවීම හා නාම පුවරු සවිකිරීම සඳහා රු.10,000 ක් බැගින් රු.20,000 ක් ගෙවා තිබුණද, එවැනි පැළ සිටුවීමක් හෝ නාම පුවරුවක් සවිකර නොතිබුණි. | මෙම මාර්ගයට අදාළ පැළ උලපනේ ඩෙන්මාර්ක් කසල අංගනය පිහිටි භූමියේ සිටුවා ඇති බව. | ඇස්තමේන්තුව අනුව කාර්ය ඉටු කළ යුතුය. |
| (ඇ) | **ගඟ ඉහළ වෙළඳ සංකීර්ණය ඉදිකිරීම - රු.74,612,900** | | |
| i. | මෙම වෙළඳ සංකීර්ණය ඉදිකරන භූමිය ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වුවද මෙම ඉඩම පවරා ගැනීමකින් තොරව ඉදිකිරීම් කරමින් පැවතුණි. | ස්ථාවර තැන්පතුව කල් පිරීමෙන් පසු ඉඩම පවරා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම් පවරා ගෙන ඉදිකිරීම් කළ යුතුය. |
| ii. | ගොඩනැගිලි සම්මත රේට විග්‍රහයේ රේටයන් (BSR) හා කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කළ මිල ගණන් අතර වැඩ විෂයයන් 18ක සියයට 75 සිට 866 දක්වා විචලනයක් පැවතීම හේතුවෙන් | දෙපාර්තමේන්තු මිළ ගණන් වලට එකඟ වීම මත කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලද බව. | ඇගැයීම් කමිටු නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු 5,326,627.ක මුදලකට වැඩිපුර කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා වැඩි අගයක් දක්වා ඇති මිල ගණන් පිළිබඳව අවධානය යොමුකළ යුතු බව දක්වා තිබියදීත් ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | | |
| iii. | ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2022 පෙබරවාරි 07 දින මාස 10 ක කාලයකින් වැඩ අවසන් කිරීමට ගිවිසුම් අත්සන් කර, සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 14 දින වැඩ නිම කළ යුතු බව දන්වා තිබුණ ද, තවත් මාස 03 කට කාලය දීර්ඝ කර දී තිබුණි. එම කාලය 2023 පෙබරවාරි 14 දින වන විට අවසන් වුව ද, ගොඩනැගිල්ලේ අත්තිවාරම් මට්ටම දක්වා පමණක් ඉදිකිරීම් නිම කර තිබුණි. | භාණ්ඩවල වෙළඳ පොළ මිල උච්චාවචනය විම හා වෙළඳ පොළ පැවැති භාණ්ඩ හිගය යන හේතුන් නිසා, කොන්ත්‍රාත්තුව නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වූ බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

4. **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**තිරසාර සංවර්ධන අරමුණු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක 10 ක් හඳුනා ගෙන ඇතත්, ඉලක්ක 08 ක් වෙනුවෙන් කිසිදු මුදලක් වැය කර ක්‍රියාත්මක වී නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කරන බව | අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන ක්‍රියාත්මක කළ යුතුය |